ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>INS කරන්ජ් සබ්මැරීනය ශ්‍රී ලංකාවට පැමිණේ</u>

ඉන්දීය නාවික හමුදවේ INS කරන්ජ් සබ්මැරීනය 2024 පෙබරවාරි 03 වන දින දෙදින සංචාරයක් සඳහා කොළඹට පැමිණියේය. ශ්‍රී ලංකා නාවික හමුදවේ බලකා නිලධාරිතුමා විසින් මෙම සබ්මැරීනය උත්සවාකාරයෙන් පිළිගන්නා ලදී.

2. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා පෙබරවාරි 03 වන දින සම්බැරීනය නැරඹීමට එක් වූ අතර එතුමා සබ්මැරීනයේ අණදෙන නිලධාරි අනුරාබ් මහතා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සමඟ සුහද පිළිසඳරක ද නිරත විය. පසුව එදින, ශ්‍රී ලංකා නාවික හමුද සාමාජිකයන් 100ක් පමණ දෙනා ද සබ්මැරීනය පිළිබඳව දැනුවත් කරන ලදී. අණ දෙන නිලධාරිතුමා බටහිර නාවික විධානය භාර අණදෙන නිලධාරි සමන් පෙරේරා මහතා බටහිර නාවික මූලස්ථානයේ දී හමු වීමට නියමිත ය.

3. 2021 මාර්තු 10 වන දින ඉන්දීය නාවික හමුදවට එක් කරන ලද INS කරන්ජ් සබ්මැරීනය කල්වේරි පන්තියේ තෙවන සබ්මැරීනය යි. ඉන්දීය නාවික හමුදවට එක් කිරීමෙන් පසු INS කරන්ජ් සබ්මැරීනය විසින් සිදු කරන පළමු විදෙස් සංචාරය මෙය යි. මෙයට පෙර ජාත්‍යන්තර යෝගා දිනයට සමගාමීව කල්වේරි පන්තියේ සබ්මැරීනයක් වන INS වාගීර් සබ්මැරීනය 2023 ජූනි මාසයේ දී කොළඹට පැමිණියේය.

4. INS කරන්ජ් සබ්මැරීනයේ මෙම සංචාරය සබ්මැරීනයට අවශ්‍ය ඉන්ධන සහ අනෙකුත් සැපයුම් ලබා ගැනීමට සිදු කරන සංචාරයකි. මෙහිදී සබ්මැරීනයේ කාර්ය මණ්ඩලයට විවේකයක් ලබා ගැනීමට හැකි වන අතර කොළඹ සහ ගාල්ල වැනි ස්ථානවල සංචාරය කිරීමට ද

අවස්ථාව උදා වනු ඇත. මෙම සබ්මැරීනය 2024 පෙබරවාරි 05 වන දින දිවයිනෙන් පිටත්ව යනු ඇත.

***

***කොළඹ***
***2024 පෙබරවාරි 04***